② ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
# අති විශෙෂ

අංක 14,685/11 — 1966 මාර්තු 8 වැනි අඟහරුවාද — 1966.3.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : අයි. 108/56

### නියෝගය

(131 වෙනි අධිකාරය වන) 1957 අංක 14 හා 62 සහ 1962 අංක 4 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත්වලින් සංශෝධිතවූ කාර්මික ආරාවුල් පනතේ 22 වන වගන්තියෙන් අග්‍රාණ්ඩුකාරතුමන් වෙත පැවරී ඇති බලතල පිට, විලියම් ගොපල්ලව වන මම—

(අ) කාර්මික අධිකරණයන් සංස්ථාපනය කිරීමට තෝරා ගතයුත්තන් අඩංගු මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන්, මෙහි පහත දක්වෙන උප ලේඛනයේ නම සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි ; තවද,

(ආ) එම සාමාජිකයන්ගේ ධුර කාලය වශයෙන් 1966 මාර්තු තුන්වන දින පටන්වූ වර්ෂයක කාල පරිච්ඡේදය මෙයින් නියම කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

1966 මාර්තු 7 වැනි දින
කොළඹ දීය.

### උපලේඛනය

1. ෆ්‍රෙඩ්රික් ඒබ්‍රහම් අබේවර්ධන මහතා
2. ෆ්‍රෙඩ්රික් එමානුවෙල් අලස් මහතා
3. ජෙරාඩ් ඒවන් අමරසිංහ මහතා
4. මොහමඩ් අබ්බාස් මරිකාර් අබ්දුල් බැකී මහතා
5. ජේම්ස් ඕර්ලන්ඩෝ ද සා බණ්ඩාරනායක මහතා
6. බ්‍රිටෝ ඇලෙක්සැන්ඩර් රොද්‍රිගෝ කන්දප්පා මහතා
7. මොහමඩ් රෂීඩ් අබ්දුල් කරීම් මහතා
8. නිහාල් රංජිත් මහින්ද දලුවත්ත මහතා
9. එඩ්මන්ඩ් ඩයස් දේසිංහ මහතා
10. තම්බයියා දේවරාජන් මහතා
11. ඇන්ඩෘ මාර්කස් ගේබ්‍රියල් ද සිල්වා මහතා
12. චාල්ස් වික්ටර් සයිමන් ද සිල්වා මහතා
13. සයිමන් ක්ලැරන්ස් ස්ටුවට් ද සිල්වා මහතා
14. නිව්ටන් එදිරිසිංහ මහතා
15. වික්ටර් ෆ්ලෝරිස් ගුණරත්න මහතා
16. සෙයිදු මොහමදු අබ්දුල් හසන් මහතා
17. සිසිල් ජයතිලක මහතා
18. නාගරත්නම් පිල්ලයි ක්‍රිෂ්ණදසන් මහතා
19. නාගනාදර් කුමාරසිංහම් මහතා
20. රාජ රාම නල්ලයියා මහතා
21. පර්සි ඇල්බට් ද සිල්වා සේනාරත්න මහතා
22. සිවසිතම්පරම් සෝමනාදන් මහතා
23. සින්නදුරෙයි සුන්දරලිංගම් මහතා
24. වෝල්ටර් තල්ගොඩපිටිය මහතා
25. වෙස්ලි දුරෙයිනායගම් තමෝදරම් මහතා
26. අබ්දුල් කපූර් මොහමඩ් උවායිස් මහතා
27. හර්බට් පෙරේරා වනිගතුංග මහතා
28. ක්ලැරන්ස් වැලන්ටින් වැලිකල මහතා
29. සිසිල් ස්ටීවන් වෙත්තසිංහ මහතා
30. සමරප්පුලිගේ ආරියරත්න විජයතිලක මහතා
31. එඩ්ගාර් ඇල්බට් විජේසූරිය මහතා
32. ඩොනල්ඩ් අර්ඩ්ලි විජේවර්ධන මහතා
33. චමලි ලක්දස වික්‍රමනායක මහතා

3-526

358/41——ආර් 12826—11,325 (3/66)

අ.ආ.කා. අංකය : ඕ. 342/50

නෝර්වේය වෙනුවෙන් සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට පත් කරනු ලැබූ හෝකොන් නෝර්ඩ් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, මහා රාජිණීන් වහන්සේ වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ, 1966 මාර්තු 8 වෙනි දින.

3-527

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 7/66 දරණ ආනයන පාලන දැන්වීම

සැබෑපරිහරණ බලපත්‍ර එල්ලේ කරනු ලබන ආනයන කොටස් හරකිරීම් කොළඹ කොටුවේ නව තරුණ බෞද්ධ සංගම් ගොඩනැගිල්ලේ පිහිටි මෙම දෙපාර්තමේන්තුවේ ''රේගු අංශයේදී'' දැනට කරනු ලැබේ.

2. 1966 මාර්තු 15 දින සිට සැබෑපරිහරණ බලපත්‍ර එල්ලේ කරනු ලබන ආනයන කොටස් හරකිරීම් කොළඹ 2, ශ්‍රී ජිනරතන පාරේ අංක 46 පිහිටි කර්මාන්ත සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ආනයන පාලන අංශයේදී කරනු ලබන බව සැබෑ පරිහරණ බලපත්‍ර මත බඩු ගෙන්වන්නන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

3. එමනිසා සියලුම සැබෑපරිහරණ බලපත්‍රධාරීන් ඔවුන්ගේ ආනයන කොටස් හරකිරීම් සඳහාවූ ලියකියවිලි එදින පටන් කර්මාන්ත සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ පිහිටි ආනයන පාලන අංශයට භාරදිය යුතුයි.

4. දැනට කර්මාන්ත සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ පිහිටි ආනයන පාලන අංශයේදී කරනු ලබන සැබෑපරිහරණ බලපත්‍ර එල්ලේ කරන අවසාන ආනයන හරකිරීම් පිළිබඳ වෙනසක් නොවේ.

ඩී. සී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1966 මාර්තු මස 7 වැනි දින.

3-525

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි